සැ. යු.- 2011.03.04 දින පළ වූ අංක 1,696 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.
2011.02.25 දින අංක 1,695 දරන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2011 වර්ෂය සඳහා කොළඹ මහාධිකරණයේ ජූරි සභිකයින්ගේ නාමාවලියක් පළවේ.
මෙම *ගැසට් පත්‍රයේ* දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,697 - 2011 මාර්තු මස 11 වැනි සිකුරාදා - 2011.03.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 774 |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 775 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 මාර්තු මස 18 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 මාර්තු මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ආණ්ඩුකාරවරුන් විසින් කරන පත්කිරීම් ආදිය

**1987 අංක 42 දරන පළාත් සභා පනතේ IV වැනි කොටසේ 32(1) වගන්තිය යටතේ වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් කරන ලද පත්වීම්**

| අනු . අංකය | නම/සේවය/පන්තිය | පත්කරන ලද තනතුර/කාර්යාලය<br>ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|
| 01 | ප්‍රදීප් තිලකරත්න මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. III පංතිය | 2010.11.04 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි කුරුණෑගල මහ නගර සභාවේ නියෝජ්‍ය නාගරික කොමසාරිස් තනතුර සඳහා |
| 02 | ඒ. කේ. ඩබ්. ඩබ්. එම්. එන්. කේ. වීරසේකර මෙනෙවිය<br>ශ්‍රී. ලං. ප. සේ. I පංතිය | 2011.01.04 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ, ආණ්ඩුකාරවර ලේකම් තනතුර සඳහා |
| 03 | ජේ. ජී. එන්. ධර්මසිරි මහත්මිය<br>ශ්‍රී. ලං. ප. සේ. I පංතිය | 2011.01.04 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) තනතුර සඳහා |
| 04 | වී. මාලනී මහත්මිය<br>ශ්‍රී. ලං. ප. සේ. I පංතිය | 2011.01.04 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පුහුණු) තනතුර සඳහා |
| 05 | කමල් අමරසිංහ මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. II පංතිය | 2011.01.07 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා |
| 06 | එච්. පී. එම්. එස්. ඩී. පතිරාජ මහතා<br>ශ්‍රී. ලං. ග. සේ. I පංතිය (අධිසේවක) | 2010.11.02 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ, අයවැය අධ්‍යක්ෂ තනතුර සඳහා |
| 07 | එන්. කේ. බී. ඒ. ජී. නරසිංහ මහතා<br>ශ්‍රී. ලං. ග. සේ. I පංතිය (අධිසේවක) | 2010.12.03 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, ගණකාධිකාරී තනතුර සඳහා |
| 08 | කේ. ඒ. එන්. ප්‍රේමරත්න මහතා<br>ශ්‍රී. ලං. ඉං. සේ. I පංතිය | 2009.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ, පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා |
| 09 | ආයු. වෛද්‍ය ජී. එච්. එම්. උත්පලානි හේරත් මැණිකේ මහත්මිය<br>ආයු. වෛ. සේ. I පංතිය | 2010.04.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් ආයුර්වේද කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුරේ වැඩ බැලීම සඳහා |
| 10 | ආයු. වෛද්‍ය ආර්. ඒ. චමින්ද කුමාර මහතා<br>ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | 2011.01.11 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි මාවතගම ප්‍රාදේශීය සභාවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරී තනතුර සඳහා |
| 11 | ආයු. වෛද්‍ය එච්. කේ. පී. ආර්. හල්ලොළුව මහත්මිය | 2011.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කුලියාපිටිය නගර සභාවේ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ආයුර්වේද වෛද්‍ය නිලධාරී තනතුර සඳහා |
| 12 | ආයු. වෛද්‍ය එච්. ජී. චන්දන මහතා<br>ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | 2011.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අලව්ව ප්‍රාදේශීය සභාවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරී තනතුර සඳහා. |

ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි,

කුමාරි වීරසේකර,
වයඹ ආණ්ඩුකාරවර ලේකම්.

2011 පෙබරවාරි මස 15 වැනි දින,
වයඹ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

03-178

# තනතුරු - ඇබෑර්තු

## සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ දුරකථන ක්‍රියාකරු/පිළිගැනීමේ නිලධාරි III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ දුරකථන ක්‍රියාකරු/පිළිගැනීමේ නිලධාරි III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත දක්වා ඇති සුදුසුකම් ඇති සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පවතින පුරප්පාඩු ප්‍රමාණය 02කි.

03. *අයදුම් කිරීම සඳහා තිබිය යුතු සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

(ii) මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුයි.

(iii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන්නන් අයදුම්කරුවන් වූ විටක ඔවුන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.).

(iv) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සබරගමුව පළාත් සභා බල ප්‍රදේශයේ අවම වශයෙන් වසර 03ක අඛණ්ඩ කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙකු වීම.

(v) *අධ්‍යාපන සුදුසුකම් :*

සිංහල භාෂාව සහ අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ අංක ගණිතය ද, ඉංග්‍රීසි භාෂාව ද, ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් හතරකින් සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් එක්වර සමත්වීම ;

හෝ

සිංහල භාෂාව, ගණිතය ඇතුළු විෂයයන් හතරකට "බී" ශ්‍රේණියට නොඅඩු සාමාර්ථයක් සහිතව ඉංග්‍රීසි භාෂාව ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් හයකින් එක්වර ජාතික පොදු සහතික පත්‍ර විභාගයෙන් සමත්වීම ;

සහ

ඕනෑම විෂයය ධාරාවකින් අ. පො. ස. (උසස් පෙළ) විෂයයන් 03කින් සමත්වීම.

ඉංග්‍රීසි භාෂාවෙන් චතුර ලෙස කථාකළ හැකි විය යුතු ය. දෙමළ භාෂාව පිළිබඳ ව්‍යවහාර දැනුමක් තිබීම ද අවශ්‍ය වේ.

(vi) *වෙනත් සුදුසුකම් :*

අවම වශයෙන් වර්ෂයකවත් අදාළ ක්ෂේත්‍රයේ රාජකාරී පිළිබඳ පළපුරුද්ද,

පරිගණක භාවිතය පිළිබඳ අවම වශයෙන් මාස 03කට වැඩි කාලයක සහතික පත්‍ර පාඨමාලාවක් හෝ ඊට ඉහළ පාඨමාලාවක් සාර්ථකව හදාරා තිබීම.

04. *වැටුප් ක්‍රමය.-* රු. 13,120-10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320- රු. 22,040/- වේ.

(රා. පරි. චක්‍රලේඛ අංක 6/2006 (IV) හි එම්. එන්. 1-2006ඒ).

05. *අයදුම් කිරීමේ ක්‍රමය හා අදාළ තොරතුරු :*

(i) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව ඒ 4 (සෙ. මී. 21 x 29) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් සකස් කරගත් අයදුම්පත්‍රයක් මගින් මෙහි පහත 05 (V) සඳහන් කර ඇති පරිදි තම අත්සන සහතික කරවාගෙන අයදුම්කළ යුතු ය. පළමු පිටුවේ අංක 01 සිට 10 දක්වා ද ඉතිරි ඡේද දෙවන පිටුවේ ද වශයෙන් අයදුම්පත්‍රය සකස් කරගත යුතු ය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2011.04.29 දින වේ. අයදුම්පත්‍රය එවිය යුතු ලිපිනය "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත් සභා සංකීර්ණය, නව නගරය, රත්නපුර" වේ. අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, එය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "දුරකථන ක්‍රියාකරු/පිළිගැනීමේ නිලධාරි තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු ය. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ තනතුරක් දරන නිලධාරියෙකු අයදුම්කරුවෙකු වන්නේ නම් ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය තමා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය. එසේ තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මුදල් ගෙවන ලද කුවිතාන්සිය හැර අයදුම්පත්‍රය සමග වෙනත් කිසිදු ලියවිල්ලක් නොඑවිය යුතු ය.

(ii) සෑම අයදුම්කරුවෙකුම මේ සඳහා පවත්වන ලද තරග විභාගය වෙනුවෙන් විභාග ගාස්තුවක් ගෙවිය යුතු ය. විභාග ගාස්තුව රු. 450 කි. විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට, දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සිය අයදුම්පතේ අදාළ ස්ථානයේ ඇලවිය යුතු වේ. මෙම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභාවේ ආදායම් ශීර්ෂ 2003-90-01 දරන ශීර්ෂයට බැරවන ලෙසට ය. ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

(iii) *විභාගය පවත්වන භාෂා මාධ්‍යය .-* විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර, අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(iv) *අයදුම්පත් භාර ගැනීම .-* ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්පත්‍ර එවා ඇති සුදුසුකම් සහිත අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය පැවැත්වීමට නියමිත දින 07කට කලින් විභාග ප්‍රවේශ පත්‍ර නොලද අපේක්ෂකයන් පහත සඳහන් විස්තර ඇතිව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විමසිය යුතු ය.

විභාගයේ නම :————,
අයදුම්කරුගේ නම :————,
ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය හා ලියාපදිංචි
අංකය හා දිනය :————.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ද, අසම්පූර්ණ අයදුම්පත් ද, නිසි පරිදි සබරගමුව පළාත් සභාවේ ආදායම් ශීර්ෂයට බැරවෙන සේ විභාග ගාස්තු ගෙවා නැත්තා වූ හෝ එම ගෙවීමට අදාළ කුවිතාන්සිය අලවා නොඑවන අයදුම්පත් ද, අදාළ සුදුසුකම් නොමැති අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය එවීමට ප්‍රථම මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර තමා සපුරා තිබේ ද යන්න ගැන අයදුම්කරු සෑහීමකට පත්විය යුතු ය. විභාගයට ඉදිරිපත් වීමට ඉඩදීම සුදුසුකම් පිළිගෙන තිබීමක් ලෙස නොසැලකිය යුතු ය. ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව විභාගය පැවැත්වෙන ස්ථානය තීරණය කරනවා ඇත.

(v) *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-* අයදුම්කරුගේ අත්සන සහතික කිරීම රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයත් නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 2,40,360 කට නොඅඩු වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු ලවා සහතික කළ යුතුය.

06. *තෝරා ගන්නා ක්‍රමය.-* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 අනුගමනය කරමින් මූලික සුදුසුකම් ඇති අපේක්ෂකයින් ලිඛිත විභාගයකට යොමුකර, එම විභාගයේ දී දක්වන ඉහලම කුසලතාවය මත සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයකින් පසුව සුදුස්සන් තෝරාගනු ලැබේ. තෝරා ගැනීමේ ගැටළුවක් ඇතිවුවහොත් ඒ පිළිබඳ අවසන් තීරණය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබනවා ඇත. මෙම අයදුම්පත් කැඳවීම මත පුරප්පාඩු පිරවීම පිළිබඳ අවසන් තීරණය ගැනීම සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

07. *ලිඛිත විභාගය.-* ලිඛිත විභාගය විභාග කොමසාරිස් ජනරාල්/සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැය දෙකක සාමාන්‍ය දැනීමේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

(ප්‍රශ්න පත්‍රයෙන් සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40%ක් හෝ ඊට වැඩිවිය යුතු ය.)

විභාගය පැවැත්වෙන අවස්ථාවේ දී විභාගයට පෙනී සිටීම සඳහා ලැබී ඇති විභාග ප්‍රවේශ පත්‍රය හා අයදුම්කරුගේ අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේම විභාගය පැවැත්වීමේ දී අනුගමනය කරන නියමයන් හා කොන්දේසි ද අයදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු ය.

08. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.-* මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. පත්වීම් ලබන්නන් පත්වීම් දින සිට වර්ෂ 03ක පරිවාස කාලයකට යටත් කරනු ලබන අතර, ඔවුන් ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හා විටින් විට රජය හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන නියෝගවලට ද යටත් විය යුතු ය.

09. *වෙනත් කරුණු.-*විභාගය පැවැත්වීමෙන් පසුව විභාගයේ දී ඉහළම ලකුණු ලබා තිබීම මත සුදුසුකම් පරීක්ෂා කර බැලීම සඳහා කැඳවූ විටෙක අයදුම්පත්‍රයේ සඳහන් සත්‍ය තොරතුරු සනාථ කිරීමට අවශ්‍ය ලියවිලි ද, විශේෂයෙන්ම තමා අයදුම් කළ දිස්ත්‍රික්කය, ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා නියම කරනු ලබන ලියවිලි ඉදිරිපත් කිරීමට සූදානමින් ද සිටිය යුතු ය. අයදුම්පත්‍රයේ අසත්‍ය තොරතුරු සඳහන් කර තිබීම අපේක්ෂකත්වය අවලංගු වීමට හේතුවක් වන අතර, පත්වීමක් ලැබුවාට පසුව අසත්‍ය හෝ වැරදි තොරතුරු ඇතුළත් කර අයදුම් කළ අයෙකු බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට ද යටත් වේ. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන තීරණයක් ගැනීමේ අයිතිය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

සුනේත්‍රා ගුණවර්ධන,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.

2011 පෙබරවාරි මස 21 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
සබරගමුව පළාත් සභා සංකීර්ණය,
නව නගරය - රත්නපුර.

### ආදර්ශ අයදුම් පත්‍රය

***සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ දුරකථන ක්‍රියාකරු/පිළිගැනීමේ නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයේ අයදුම් පත්‍රය***

විභාග අංකය : [ ]

(කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා)

01. මුලකුරු සමග නම :

(i) ඉංග්‍රීසියෙන් :————.
(ii) සිංහලෙන්/දෙමළෙන් :————.

02. සම්පූර්ණ නම :

(i) ඉංග්‍රීසියෙන් :————.
(ii) සිංහලෙන් :————.

03. විභාග ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :

(i) ඉංග්‍රීසියෙන් :————.
(ii) සිංහලෙන් :————.

04. ස්ථිර පදිංචිය පිළිබඳ සුදුසුකම් ලබා ඇති දිස්ත්‍රික්කය : [ ]

05. ස්ත්‍රී/පුරුෂ භාවය : [ ]
(ස්ත්‍රී - F පුරුෂ - M )

06. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]
(සිංහල/දෙමළ/ඉංග්‍රීසි)

07. දුරකථන අංකය :————.

08. උපන් දිනය :

2011.04.29 දිනට වයස : අවු. :————, මාස :————, දින :————.

09. ජාතික හැඳුනුම්පත් අංකය :————.

10. අධ්‍යාපන සුදුසුකම් ;

(i) අ. පො. ස. (සා. පෙළ) විභාගය :-

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගය :-

11. වෙනත් සුදුසුකම් :————.

12. තමාගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයට අදාළ පහත තොරතුරු දක්වන්න ;

(i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම :————.
(ii) 2011.04.29 දිනට සබරගමුව පළාත් බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති කාලසීමාව :————.

13. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිරතව සිට කිසියම් හේතුවක් මත ඉන් ඉවත් වී හෝ ඉවත්කර ඇති අයෙකු නම්, දැරූ තනතුර, සේවය කළ දෙපාර්තමේන්තුව හා ඉවත්වීමට හේතුව සඳහන් කරන්න. :————.

14. කිසියම් සාපරාධී වරදකට අධිකරණයෙන් දඬුවම් ලබා ඇත් ද? එසේ නම් විස්තර දක්වන්න :————.

15. විභාග ගාස්තුව වශයෙන් රු. 450ක මුදලක් සබරගමුව පළාත් සභාවේ ආදායම් ශීර්ෂයට බැරවන සේ ගෙවීම් පිළිබඳ තොරතුරු ;

එම මුදල් ගෙවූ දිනය :————.
ගෙවූ කාර්යාලය :————.
ඒ සඳහා ලැබුණ ලදුපත් අංකය :————.

(විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත මෙම අයදුම්පතට අමුණා එවිය යුතු ය.)

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. බඳවා ගැනීමේ විභාගය පිළිබඳ කොන්දේසි අනුව ම විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ————.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන.......................................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය................................ .දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර හා නිල මුද්‍රාව :————.

රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය ද දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියෙකු විසින් කළ යුතු ය.

(i) මෙම දෙපාර්තමේන්තුවේ ............................................................... දින සිට ................................................... තනතුරේ සේවය කරන ............................................................................ මහතා/මහත්මිය/මෙනවිය ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට උපයාගත යුතු සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අවවාද කිරීම් හැර කිසිදු විනය දඬුවමකට භාජනය වී නොමැති බවත් අයදුම්පතේ සපයා ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත් සහතික කරමි.

(ii) ඉහත තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගතහොත් අයදුම්කරු දැනට දරන තනතුරෙන් මුදාහැරිය හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවියේ නාමය :————.
දිනය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය (කරුණාකර නිල මුද්‍රාව තබන්න) :———.

03-399

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.